

# ත්‍රිමානකරණයේ අරුමය

**ලූ මැසුවෙලි, "ස්ටාර් වෝස්" පිළිබඳ අතිශය කනස්සල්ලෙන් පසුවන්නෙකි. "පසුව පැමිණි චිත්‍රපට ද, මුල් චිත්‍රපට තරම් සාර්ථක වූවා නම්" යැයි ඔහු අපේක්ෂා කළාය යන්න ඉන් අදහස් නොවේ. එසේ නම්, ඒ "Jedi" ඇසිදිසියෙහි චරිතවලට යොදගත් ආලෝක කදම්බ මඟින් මවන ත්‍රිමානරූප පිළිබඳයි. "එය හරියටම "Princess Leia's pleading for heip" හී "R2 – D2" ව්‍යාපෘති අයුරුමයි. එම රූප සැකසුම් අපේක්ෂණය අතිශය උසස්" ඔහු තැතිගැන්මෙන් යුතුව පවසයි. "මෙය කර්මාන්තයේ කඩාවැටීමක්."**

ඒ ත්‍රිමානරූප (3-D) කර්මාන්තයයි. බොහෝ දෙනා සිතනුයේ එය වීඩියෝ තිර මතට පැමිණෙද්දී සිහින් සහ පැතලිවීම වඩාත් උචිත බවය.

මැසුවෙලි සේවය කරන, නෝවෝක් හී "Light Space Technologies" ඇතුළු බොහෝ පර්යේෂණ කණ්ඩායම් දැන් සටන්වැද සිටින්නේ රූපවාහිනියට සහ සෙසු වීඩියෝ ප්‍රදර්ශකවලට 3- D තාක්ෂණය හඳුන්වාදීමටයි. මෙහිලා වූ ප්‍රධාන ගැටලුව ඔවුනට තවමත් "R2-D2" සමඟ තරඟ වැදීමට නොහැකි වීමයි.

එහෙත්, සිහින් වායු ධාරාවක් මෙන් දිස්වන කදම්බයක් තුළට3-D චංචල රූප ඇතුළු කිරීමට තරම් පුදුම උපද-වනසුලු ප්‍රගමන අත් කර ගැනීමට ඔවුන් සමත්ව සිටී.

වසර කීපයක් තුළදී මේ නව ප්‍රවණතා මහාමාර්ග, රූස්වීම්ශාලා වගේම ඇතැම් විට ඔබේ කුඩා කුටිය තුළට ද පැමිණීම ඇරඹෙනු ඇත.

ටෙක්සාස් හී "Zebra Imaging" හී ප්‍රධාන විධායක නිලධාරී රොබින් කර්ල් පවසන්නේ, මේ මඟින්, විනෝදස්වාදය ලැබීම මුළුමනින් ම වෙනස් මඟකට පිවි-සෙනු ඇති බවය.

"අප ජීවත්වන්නේ ත්‍රිමානරූපී (3-D) ලෝකයේ, ඒත් රූපවාහිනිය සහ චිත්‍රපට ද්වීමානරූපීව (2-D) හෝ නැරඹීමට අපට තවමත් නොහැකි වී තිබෙනවා" ඔහු නවදූරටත් පවසයි.

සැබෑ ත්‍රිමානරූප ලබාගැනීමට නම්, ඔබේ දෑස් තනි තනිව දෘෂ්‍ය වශයෙන් වෙනස් රූප දැකිය යුතුය. සම්ප්‍රදායානුකූල ත්‍රිමානරූපවලදී, රූප දෙකම සැලසුම්කර තිබෙන්නේ, එක මත එක පිහිටි ආකාර-යට ය. මෙහිදී ප්ලාස්ටික් කණ්ණාඩි යුග-ලක් ඔබට අවශ්‍ය වන්නේ එබැවිනි. එහි එක් එක් කාචය මඟින් රූප පෙරා වෙන්-කර ඔබේ දෘෂ්ටියට ලබා දේ.

නවමු රටාවේ ත්‍රිමානරූපී වීඩියෝ ප්‍රදර්ශක SHARP හාPHILIPS වෙළෙඳ නාම යටතේ ලබාගත හැකිය. ඒ ඩොලර් 1,500 වැනි මුදලට ය.

මෙහිදී තිරය සඳහා, වීදුරු වෙනුවට වෙනත් උපක්‍රමයක්, ඔවුන් යොදගෙන තිබේ. මෙහිදී තිරස් පටි ආකාරයට එක්-තැන් කළ විවිධ රූප, විශේෂිත ආලේපන හා ෆිල්ටර යොද ගනිමින් ගොඩනැගූ තිරය මගින්, එක් එක් ඇසට, එකිනෙකට වෙනස් වූ පටි කට්ටල වශයෙන් දැකීමට සැලැස්වේ.

මෙවැනි තිර නිෂ්පාදනය වඩාත් පහසු අතර, ජපානයේ අලෙවි වූ ලැප්ටොප් පරිගණක හා ජංගම දුරකථනවල පවා දැකිය හැකි විය. නමුත් ඒවාට එක්තරා අත්දමේ සුවිශාල පසුබෑමක් ද විය. එනම් ත්‍රිමාන රූප එකලස් කිරීමට යෑමේදී ඇස් හා මොළය අධික ලෙස වෙහෙසීමෙන් හිසරදය, කරකැවිල්ල, වමනය වැනි ලක්ෂණ මතුවිය හැකි වීමය.

විශිෂ්ට මට්ටමේ 3-D ප්‍රදර්ශකයක් කිසිවිටෙක ඇස් රැවටීමක් සිදු නොකරයි. එහි රූප සත්‍ය ලෙසම මුළු අවකාශයම පුරවාලයි. Minority Report චිත්‍රපටය ඊට නිදසුනකි. එබැවින්, නරඹන්නා දෙසට හා ඉවතට රූප යොමු කරවීම සඳහා චලනය වන හෝ බහු ආංගික පැතලි තිර සහිත, පරිමාමිතික ප්‍රදර්ශක නිපදවීමට ඇතැම් සමාගම් පෙළඹී තිබේ.

තත්ත්වාකාර ක්‍රමවලදී, නිදසුනක් ලෙස බර්ලින්වත් හා මැසචුසෙට්ස්වල තත්ත්පරයට පහළොස්වරක කැරකෙන තිරයක් යොද ගනී. මේ අතර එකිනෙකට වෙනස් ප්‍රදර්ශන 200 කට අධික රූප සංඛ්‍යාවක් තිරය මත මවමින් ප්‍රක්ෂේපන යන්ත්‍රය මගින් ආලෝකය විමෝචනය කෙරේ.

නැරඹිය හැකි තරම් වේගයෙන් තිරය කැරකැවීම නිසා, හරියටම අවකාශයේ පාවෙමින් මෙන් පෙනෙන්නට තිබෙන ත්‍රිමාන වස්තුවක් නිර්මාණය කර ගැනීමට, නරඹන්නාගේ මොළය මගින් වෙනස් වූ දර්ශන එක්තැන් කර සම්බන්ධ කරගනු ලැබේ. මේ මගින් පැතලි තිර මගින් ඇතිවන අපහසුව මගහැරෙනු ඇත.

"Light Space" සමාගම ද වෙනස් වූ උපක්‍රම යොද ගනී. ඔවුන්ගේ ප්‍රදර්ශක, වෙනස් වූ තුනී තිර 20 ක් එකක් ඉදිරිපස එකක් වන සේ ස්ථානගත කිරීමෙන් සෑදෙන අතර, ක්‍රමයෙන් ආලෝකය විමෝචනය කිරීමෙන් ඒ එක එකක් මත රූප ඇති කෙරේ. ඒ අනුව ඉතා සියුම් ලෙස සම්පූර්ණ ත්‍රිමාන රූපයම ගොඩනැගේ.

"අපේ ප්‍රදර්ශක පැය 10 ක් වුවත් නරඹන්න ඔබට පුළුවන්. වමනය දමන බෑග් ආදියත් නොරව" සමාගමෙහි වෙළෙඳ කටයුතු ප්‍රවර්ධන නිලධාරී මැසුවෙලි පවසයි. එය වීඩියෝ ක්‍රීඩාවලට ඇබ්බැහි වූවන්ට සුබදායක පණිවුඩයකි. ඔවුනට දැනටමත්, පරිගණක හා වීඩියෝ ක්‍රීඩා තෝරා ගැනීමට, ත්‍රිමානරූපී ලෙස ක්‍රියාත්මක විශාල පරාසයක් තිබේ.

> මෙහි අසුබ ආරංචිය නම්, Light Space සමාගමේ ප්‍රදර්ශක ඩොලර් 50,000 ක් වීමය. එහෙත්, සමාගමේ අපේක්ෂාව එය ඩොලර් 15,000 දක්වා පහත හෙළීමය. ත්‍රිමානරූපී ඉදිරිපත් කිරීමෙහි නවීනතම ක්‍රමය වූ, ආලෝක කදම්බ මගින් ත්‍රිමාන රූ මැවීම හෙවත් හොලෝග්‍රෑව ක්‍රමය සඳහා සමාගම් කීපයක් විශිෂ්ට ලෙස මඟ පාදාගෙන තිබේ. ඇස නොරවටන එකම 3-D ක්‍රමය හොලෝග්‍රෑම ක්‍රමයයි. රූපයක කොටසින් කොටස එකතුවී එය මොළයේ දී තනි රූපයක් ලෙස ගොඩනැගෙනවා. වෙනුවට, හොලෝග්‍රෑම ක්‍රමයේදී සම්පූර්ණ රූපයම නිර්මාණය වේ.

මෙහි අසුබ ආරංචිය නම්, Light Space සමාගමේ ප්‍රදර්ශක ඩොලර් 50,000 ක් වීමය. එහෙත්, සමාගමේ අපේක්ෂාව එය ඩොලර් 15,000 දක්වා පහත හෙළීමය.

ත්‍රිමානරූපී ඉදිරිපත් කිරීමෙහි නවීනතම ක්‍රමය වූ, ආලෝක කදම්බ මගින් ත්‍රිමාන රූ මැවීම හෙවත් හොලෝග්‍රෑව ක්‍රමය සඳහා සමාගම් කීපයක් විශිෂ්ට ලෙස මඟ පාදගෙන තිබේ. ඇස නොරවටන එකම 3-D ක්‍රමය හොලෝග්‍රෑම ක්‍රමයයි.

රූපයක කොටසින් කොටස එකතුවී එය මොළයේ දී තනි රූපයක් ලෙස ගොඩනැගෙනවා වෙනුවට, හොලෝග්‍රෑම ක්‍රමයේදී සම්පූර්ණ රූපයම නිර්මාණය කිරීම සිදු වේ. එවිට එය එක්වරම තියම රූපයක් ලෙස ඇස මත පතිත වේ. මෙවැනි රූපයක වටේ අවිදිනවාක් මෙන් පාර්ශ්වික හා පසු පෙනුම පවා නැරඹීමට අපට පුළුවන. ඔබ නරඹන දෙය හරියටම ඔබ ඉදිරියේ ඇතුවාක් මෙන් මෙවිට දිස් වේ.

මෙහි ඇති අභියෝගයට නම්, ඇතැම් කිරණ අවහිර කරමින්ද, අනෙක්වා ශක්තිමත් කරමින්ද සැහැල්ලු කිරණ අපවර්තනය කරන තිරය මත, ඉතා සියුම්ලෙස, සුදුසු රටා ගොඩනැංවීම ය. වීඩියෝ ප්‍රදර්ශකවල යොද ගැනීම සඳහා, මෙම රූප වඩාත් කුඩා හා සංකීර්ණ බවට ඔප්පු වී තිබේ. ඡායාරූපකරණ තැටි මත වූ නිශ්චල රූප සඳහා හොලෝග්‍රෑම ක්‍රමය අතිශයින් සීමා කරනු ලැබේ.

Zebra Imaging සමාගම ඇමරිකානු හමුදාවට ඇති ගැටලු පිළිබඳව ද වෙහෙසෙමින් සිටී. ඔවුන්ගේ අපේක්ෂාව එහි අණදෙන නිලධාරීන්ට නාගරික භූ දර්ශක පිළිබඳ වේගවත් ත්‍රිමාන දර්ශන ලබා දීමය.

මෙතෙක් දැක ඇති සියලු චලන රූප ක්‍රමවලට වඩා වර්ණ වීඩියෝ හොලෝග්‍රෑම ක්‍රමය වඩාත් යථාර්ථවාදී බව පෙනේ. එම ක්‍රමය සම්පූර්ණ කර ගතවී ඇත්තේ වසර 4 කි. මූලික හඳුන්වාදීම තවමත් රාජ්‍ය අංශය සඳහා පමණක් පවතී.

නමුත් ප්‍රධාන විධායක නිලධාරී Curle පවසන්නේ එහි වියදම ක්‍රමයෙන් අඩුකිරීමට සමාගම සැලසුම් කරන බවයි. එහෙත්, පාරිභෝගිකයන්ට ඔරොත්තු දිය හැකි හොලෝග්‍රැෆික වීඩියෝවක් ලබා දීමට තවත් වසර කීපයක් ඇවැසි වනු ඇත.

මෙහිලා නව උපක්‍රම යොද ගනිමින්, අවශ්‍ය තත්ත්ව ඉහළ නංවා වටිනාකම පහළ හෙළීමට සමාගම යත්න දරයි.

පර්යේෂණාගාරයේ පාරිභෝගික ඉලෙක්ට්‍රොනික පර්යේෂණ වැඩසටහනේ අධ්‍යක්ෂ, කණ්ඩායම් නායක මයිකල් බෝව්, අනාවැකි පළ කරන්නේ මධ්‍යම ෂසර්ජක හොලෝග්‍රැෆික ප්‍රදර්ශනයක ප්‍රතිඵලය, නිශ්චිත පරිගණක මොනිටරයක ප්‍රමාණයෙන් යුක්ත විය හැකි අතර, එය ක්‍රියා කරනු ඇත්තේ යන්තමින් තව්කරණය වූ පෞද්ගලික පරිගණකයක් සමඟ පමණි. එහි වටිනාකම ඩොලර් 500 - 10,000 අතර වනු ඇත.

ලබන වසරේ මුල් භාගයේ, ක්‍රියාකාරී මූලාකෘතියක් එළිදැක්වීමට කණ්ඩායම සූදනම් වේ. මීළඟ වසර හෝ දෙක තුළ එය නිෂ්පාදනයක් ලෙස එළි දැක්වීමේ හැකියාව ද ඒ සමඟ ම උදා වනු ඇත. ඇත්තවශයෙන්ම, ක්‍රීඩා හැරුණු විට, වෙනත් 3-D නිර්මාණ නැරඹීමට එය වඩාත් සුදුසු නොවේ. ❑

නිව්ස්වීක් ඇසුරෙනි
ලලනි